# අග්නි දෙවි

බ්‍රහ්මගේ වැඩිමහල් පුත්‍රයාය. ස්වාහාගේ ස්වාමි පුරුෂයා ය. පවක, පවමාන, සුචී නම් දරු තිදෙනාගේ පියා ය. අත් හතරකි. භාරත ජන විශ්වාසයට අනුව අටදිග්පති දෙවිවරුන්ගෙන් කෙනෙකි. තවත් තැනක කියන්නේ සප්ත ඍෂිවරුන්ගෙන් කෙනෙකු බවය. පරණවිතාන මහතාගේ මතයට අනුව ඉසුරුමුණි විහාරයේ 'මිනිසා හා අශ්වහිස ' කැටයමෙන් අග්නි දෙවි හා පර්ජන්‍ය දෙවි නිරූපණය වෙයි.

අග්නි යන්නෙහි වාච්‍යාර්ථය 'ගින්න' යන්නයි. ගින්නෙහි ඇති නොයෙකුත් ගුණ නිසා පුරාණ ඉන්දියාවේ හා ඉරානයේ වැසියෝ ගින්න දේවත්වයෙන් යුතුව පිදූහ. ගින්න ප්‍රබලය. විනාශකාරීය. (තද රොසාව ගිනිවිස කරවලුත් යනුවෙන් සඳකිඳුරුදා කවෙහි (307) දැක්වේ. ගින්න සේ විස කරවලා නම් සර්පයා ගැන ඉන් කියැවේ.) එහෙත් ඒ ගින්නම මිනිසාට වගා බිම් සකසා ගැනීමට ද ආහාර පිසගැනීමට ද උපකාරී වෙයි. ආලෝකය සපයා දෙයි. අලිඇතුන් ඈ සතුන්ගෙන් ආරක්ෂාව සලසා දෙයි. සීතල දුරැර උණුසුම සපයා දෙයි. එබැවින් ගින්න සුවිශේෂය. ගින්න දේවත්වයට පත්වූයේ ද එබැවිනි. අග්නි දෙවි භූ ලෝකවාසි දෙවියෙකි. බෘහස්පති ද අග්නිගේ අවතාරයකි. ඒ. එල්. බෂාම් මහතාට අනුව අග්නි යන්න ලතින් බසෙහි ignis යන්න හා සාම්‍ය වේ.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

ගිනිදළුවෙහි ඇති ඇසට නොපෙනෙන බලය දේවත්වයෙන් පිදූ ඉන්දු හා ඉරාන වැසියෝ පසුව එයට මානුෂ හැඩයක් ලබාදුන් වග මේ යුගය හා ඊට පසු යුග වලට අයත් සාහිත්‍යයික කෘති පරිශීලනයෙන් පෙනී යයි. වේද සාහිත්‍යයේ අග්නි දෙවියන් පිළිබඳ විවිධ කතාන්දර මෙන්ම ඔහුගේ පරපුර පිළිබඳව ද සඳහන් කොට ඇත. ස්වභාවික බලවේගයක් දේවත්වයට පත්ව වන්දනීය පුද්ගලයෙකු ලෙස මිනිස් සිත් තුළ තැන්පත් වූ අයුරු එයින් අවබෝධයට ගත හැකිය.

ඉන්ද්‍ර හා සූර්යට අමතරව වේද සාහිත්‍යයේ එන අනෙක් ප්‍රධාන දේවයා අග්නි දෙවියායි. ඔහු දෙවැනි වූයේ ඉන්ද්‍රට පමණි. වෛජයන්ත තන්ත්‍රයට අනුව අග්නි දෙවි බ්‍රහ්ම විසින් කළ ඔටුන්නක් පැළඳ සිටී. (අග්නිදෙවා විප්‍රමෞලිඃ - මාත්‍රුසෞවර්ණකං විධෙත් - මූර්ධිනි ප්‍රදේශෙ ජායන්තෙ - විශ්වකර්මනා සෘෂ්ටිතම් - 47 ශ්ලෝකය) සෘග්වේදය මන්ත්‍ර දෙසීයකින් පමණ අග්නි දෙවියා පිළිබඳ විස්තර කර ඇත .

ඉන්ද්‍ර දෙවියාගෙන් යුධ ජය පැතුවා සේ ම සෘග්වේද යුගයේ මිනිසුන් අග්නි දෙවියාගෙන් සමෘද්ධිය හා සන්තුෂ්ටිය පැතූහ. ගිනිකොණ දිගට අධිපති වේයා ලෙස සැලකෙන්නේ ද අග්නි දෙවියාය.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

අග්නි දෙවි පිළිබඳව ද සඳහන් වන සාහිත්‍ය කෘති මාර්ගයෙන් අග්නි දෙවියන්ගේ පෙළපත් තොරතුරු ද ගතහැක. ඊට අනුව හේ අහසේ හා පොළොවේ පුත්‍රයා වන්නේය. (ද්‍යූඃ හා පෘථිවි) තවත් මතයකට අනුව ඔහු විශ්වකර්ම හා ජලය නිසා ජනිත විය. (ත්වශ්ටෘ හා ජලය) ලී පතුරු දෙකක් එකට ගැටීමෙන් අග්නි උපන්නේ යැයි ද ජනප්‍රවාදයක් වෙයි. එය ඓතිහාසික සත්‍යයකි.

ඒ පිළිබඳව වැඩිදුර ඇති විස්ත ර අනුව උඩ ලී පතුර පුරුෂයෙකි.යටි ලී පතුර ස්ත්‍රියකි. අග්නි අහසෙහි උපන්නේ යැයි ද විදුලිය විසින් එය පොළොවට රැගෙන ආයේ යැයි ද තවත් මතයක් ඇත. වරුණ දෙවි ඔහුගේ එක් සොහොයුරෙක් වන අතර ඉන්ද්‍ර ඔහුගේ නිවුන් සොයුරා ය. පවක, පවමාන, සුඛී යන දරු තිදෙනාගෙන් පැවත එන දරුවන් හතලිස් පස් දෙනෙක් ද අග්නි ට වෙයි. (පවක, පවමාන, සුඛී සහ ඔවුන්ගේ දරුවන් සමග අග්නි ද එක්වූ කල ඔවුන් සතලිස් නවාකාර ගිනි වශයෙන් වායුපුරාණයේ දක්වා ඇත.)

ගින්න දෛනිකව දල්වන නිසා එය සියල්ලන්ට ම බාල යැයි ද කාලාන්තරයක් තිස්සේ ජනතාව හා වසන බැවින් සියල්ලන්ට ම වැඩිමහලු යැයි ද සෑම පරපුරක් සමගම වාසය කරන බැවින් සෑම පරපුරක් පිළිබඳවම දන්නා අයෙක් යැයි ද සැලකේ.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

වෛදික සාහිත්‍යයේ අග්නි පිළිබඳ විස්තර කරනුයේ ගින්න පිළිබඳ කරන වර්ණනාවක් ආකාරයෙනි. හිසක් හෝ පා යුගලක් නොමැති එහෙත් ගිතෙල් මුහුණක් ද ගිතෙල් කෙස් වැටියක් ද ගිතෙල් පිටක් ද ඇත්තෙකු ලෙස සඳහන් කර ඇත.ගිතෙල් අනුභවය පිණිස ඔහුට දිවවල් තුනක් හෝ හතක් ඇත්තේ ඔහුගේ ආහාරය දර හා ගිතෙල් වන බැවිනි. ඔහුගේ ප්‍රධාන පානය වන්නේ උණු කළ වෙඬරු ය. ගිතෙල් ඇසක් /ඇස් හතරක් හෝ ඇස් දහසක් ඇති මේ දෙවියාගේ ධ්වජය වන්නේ ධූමය යි. අත් හතරක් ඇති අතර එක් අතකින් ජ්වලිත තෝමරයක් දරා සිටී. වස්ත්‍රය කාල වර්ණය. ස්වර්ණවර්ණ අසුන් විසින් අදිනු ලබන සප්ත වායු චක්‍ර නම් රථයේ නැගී සිටින හෙතෙම සිය ධූම ධ්වජය ආධාරයෙන් ආකාෂය පොළොව මතට පහත් වීම වලක්වාගෙන සිටී. යාග සඳහා සිය රථයෙන් දෙවියන් වඩමවාගෙන එන නිසා අග්නි රථාචාර්යවරයෙක් ලෙස ද සැලකේ.

(අග්නිගේ රථය කුමක් වුව ද ඔහුගේ ප්‍රතිමා සමග දක්වන්නේ අශ්වයෙකුගේ හෝ බැටළුවෙකුගේ රුවකි.) වෛදික යුගයේ බ්‍රාහ්මනයෝ දිනකට තෙවරක් යාග කළ නිසාදෝ අග්නි දෙවි දිනකට තෙ වරක් ආහාර අනුභව කරන්නේ යැයි ද සැලකේ. එම සාහිත්‍ය කෘති වලට ම අනුව අන්‍ය දෙවිවරු ද ආහාර ලබන්නේ අග්නි අග්නි දේවයාගේ මුඛයෙනි.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

අමු මස් බුදින හා මළමිනී ගිල දමන දෙවායෙකු ද වන අග්නි බිලි පුද ගනිමින් ම කොඩිවින කරන්නන් ගිල දමයි. ගින්න හෙවත් අග්නිය සෑම නිවසක ම ඇති නිසා අග්නි දෙවි සෑම නිවසක ම අධිපතියා (ගෘහපතියා) ලෙස ද සැලකේ.දක්ෂ දූනුවායෙක් ද වෙයි. හෙතෙම විටෙක සූර්යයා සේ අඳුර දුරු කරයි. අග්නි දෙවි ප්‍රබල ප්‍රධාන දෙවියෙකු නිසා ම හෙතෙම දෙවියන්ගේ පුරෝහිත- හෝතෘ- අධ්වර්යු- බ්‍රහ්මන් ඈ තනතුරු දරන්නේ යැයි ද සැලකේ.ඩී.ඒ. මැකන්සි මහතා කියන්නේ අග්නි දෙවියන්ගේ ඉහත ගුණ අනුව ඔහු (ජර්මානු ජන ඇදහිල්ලක් වන) ට්‍යුටොනික් ලෝක පාලක දෙවි හෙම්දල් ට සම බවය.

අග්නි අෂ්ට මංගල වස්තූන්ගෙන් ද එකකි.

අග්නි දේව වන්දනය ඉන්දියාවේ හා ඉරානයේ ප්‍රබල ලෙස ම සිදු වූ නමුදු ගින්නට ගරු කිරීම ලොව බොහෝ ශිෂ්ටාචාර වල පැවතී ඇත . බුදුදහමේ බලපෑම නිසා බහුලව සිදු නොවූව ද ලංකාවේ පවා අග්නි දේව වන්දනය යම් තරමකට සිදු වී ඇත . මීට අමතරව ග්‍රීක රෝම ජාතීන් ද ජාතීන් ද අග්නි දෙවියා පුද ඇත.

සොරාවස්ත්‍ර(ශරතුෂ්ත්‍ර)ආගමේ ගිනි දෙවියා හැඳින්වෙන්නේ ආතර් යන නමිනි.හින්දූහු අතීතයේ පටන් ම ගිනි දෙවියා හැඳින්වූයේ අග්නි යන නාමයෙන් ම ය.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

යුදෙව්වරු ශුද්ධ වන්නිය(වන්නිය=ගින්න) දෙවියන්ගෙන් ලත් දයාදයක් ලෙස සිතා උතුම් කොට සැලකූහ. හෙෆයිස්ටොස් යන නාමයෙන් ගිනි දෙවියා හැඳින්වූයේ ග්‍රීකයෝ ය. ඔවුන් සැලකූයේ වන්නි දෙවියා සියුස් දෙවියන් නිසා හේරා ට ලැබුණු පුත්‍රයෙකු ලෙසිනි. රෝමවරු මේ දේවයා වුල්කානුස් යන නාමයෙන් හැඳින්වූහ. අහුරමස්ද නම් දේවයාගේ පුත්‍රයෙකු සේ සලකා පර්සියානුවෝ(ඉරාන වැසියෝ) අග්නි දෙවියා ආතර් යන නමින් හැඳින්වූහ.

ලංකාවේ පස්වන කාශ්‍යප හා දෙවන සේන යන රජවරුන්ගේ යුග සම්බන්ධ වාර්තා වල අග්නි දේව වන්දනය පිළිබඳ තොරතුරු ඇතිමුත් ලංකවේ අග්නිදේව වන්දය එතරම් ප්‍රචලිත වූ බවක් නොපෙනේ. බෞද්ධ සාහිත්‍යය හෝ වත් පිළිවෙත් තුළ පවා අග්නි දෙවියන්ට එතරම් වැදගත් ස්ථානයක් හිමි නොවේ. අග්නි පූජාව නොවැදගත් හා ලාමක පහත් ක්‍රියාවකැයි බුදු දහමේ ඉගැන්වේ.(නොයෙක් දෙය රැස්කොට-කළ පුද ගිනි දෙවියනට- සෙත වෙයි යනු ලොවට-පැවති බොරු මායමකි පෙර සිට....-බුදුගුණඅලංකාරය 145 කව)මීට අමතරව සුන්දරික භාරද්වාජ හා අග්ගික භාරද්වාජ වැනි පුද්ගලයින් පිළිබඳ කථා වලින් ද ඒ වග පැහැදිලි වේ.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

එහෙත් ශුබ මුහුර්තයන්හි දී ගිනි දල්වා කිරි උතුරුවා චාරිත්‍ර ඉටු කිරීම ද පහනින් බුදුන් පිදීම ද අග්නි පූජාව මුල් කොට ගත් චාරිත්‍රයක් හා පූජා විධියක් වියයුතුය.මීට අමතරව ලංකාවේ නේත්‍ර මංගල්‍ය උත්සව වල දී ගිනි දෙවියා උදෙසා ද චාරිත්‍ර ඉටු කෙරුණු වග ආනන්ද කුමාරස්වාමි මහතා විසින් රචිත මධ්‍යකාලීන සිංහල කලා කෘතිය අනුව පෙනෙයි. (මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ නේත්‍රමංගල්‍යය පිළිබඳ විස්තරය බලන්න.)

එනමුදු එය අග්නි පූජාවක් වශයෙන් නොකළහ. බෞද්ධ ග්‍රන්ථ වල අග්ගිභගවා යන නමින් හැඳින්වෙන අග්නි දෙවි ඉන්ද්‍ර බ්‍රහ්ම ආදී බෞද්ධ දේව ගනයා අතරට වැද්දගනු නොලබන දෙවියෙකි. වට්ටක ජාතකයේත් නඞ්ගුට්ඨ ජාතකයේත් ඝට ජාතකයේත් අග්ගිභගවා හා ජාතවේද යන නම් වලින් දක්වා ඇත්තේ අග්නි දෙවියන් වියයුතු යැයි සිංහල විශ්වකෝෂය කියයි.

දෙවන සේන(853-887) හා පස්වන කාශ්‍යප(ක්‍රි. ව. 913-923) රජවරුන්ගේ කාල වල ද අග්නි දෙවියන්ට සැලකිය යුතු ප්‍රමාණයේ පුද සත්කාර සිදුකෙරී ඇති බව පෙනෙයි(ලංකා විශ්වවිද්‍යාල ලංකා ඉතිහාසය 368 පිට බලන්න)එහෙත් අසල්වැසි

ඉන්දියාවට සාපේක්ෂව ලංකාවේ අග්නි දේව පූජාවය (මහින්දගමනයට පසු) එතරම් වැදගත් තැනක් හිමි වී ඇති වගක් නොපෙනේ.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.